# සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය.(2024)

01. අපේක්ෂකයාගේ නම :- ..........................................................................................
(මුලකුරු සමඟ නිවැරදිව ලියන්න)
02. පාසලේ නම :-..........................................................................................
03. පාසල් වර්ගය :-.200 තෙක්/201-500 අතර/500 ට වැඩි
04. කොට්ඨාසය :-..........................................................................................
05. කලාපය :-..........................................................................................

**සාහිත්‍ය දැනුම මිනුම**

**කලාප මට්ටම.**

**07 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

01.) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

| ප්‍රකාශය | පාඩම | කවුරුන් විසින් කියන ලද්දක්ද | කාහට කියන ලද්දක්ද. |
|---|---|---|---|
| i. “ ඔබ මා එතැනට කැඳවාගෙන ගොස් පැන දුවාවි.” | | | |
| ii. “ එතැනට දැන්ම යන්න බැහැ ” | | | |
| iii. “ මං හිතුවේ ඔයා ඔත්තුකාරියක් වෙන්න යනවා කියලා ” | | | |
| iv. “ ඔව්, ගිහින් වරෙන් ” | | | |
| v. “ඇයිතොප කුමට අවුද? ” | | | |

(ලකුණු 3x5= 15)

02.) පහත සඳහන් කවි සම්පූර්ණ කරන්න.

i. ..............................................................

..............................................................

කුමරෙකි කිතු සසුන රජගෙයි ලත් කිරුළ

බලයෙකි මෙවන් දන ඉපැදුම රටට හෙළ

ii. අටු කොටුවල තියන බැතා

................................ .........

................................ .........

ගෙන පුරවා මේ කමත

iii. ..........................................

...........................................

එම දූවිල් කුඩු පිඹ පිඹ

දේදුනුවල වැඩදමා.

iv. නිල් රෙද්දක රන් තැටියක්.

........................... .............

රන්වන් අපෙ ඉරු දෙවියෝ

.............................. ..............

v. ............................... ...............

............................... ................

ඇයි මේ සිල් ගත්තා වැනි.

මගුලට කළු නොනිසි බැවිනි.

(ලකුණු 2x5 = 10)

03.) දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලියන්න.

i. “ගොවි බිරියගේ නුවණ” කිනම් රටක ජන කතාවක්ද? ................................................

ii. ප්‍රස්තාව පිරුළක් යන්නෙහි සරල අදහස වන්නේ කුමක්ද?.........................................

iii. කුලතුංග දරුවා මූලික අධ්‍යාපනය ලැබුවේ කාගෙන්ද? ..........................................

iv. පැරැණිම ව්‍යාකරණ ග්‍රන්ථය නම් කරන්න..............................................................

v.පන්සිය්‍ය පනස් ජාතක පොත කුමන යුගයට අයත්ද? .............................................

(ලකුණු 3x5 = 15)

04.) පහත දැක්වෙන පදවල අර්ථය ලියන්න.

i. භද්‍ර - ..................................................................

ii. මුඛ්‍ය - ....................................................................

iii. පරිශ්‍රය - ....................................................................

iv. පරාභවය - ...................................................................

v. ආචීර්ණ කල්පිත - .................................................................

vi. ලබ්ධිය - .....................................................................

vii. පුනර්ජීවය - ...................................................................

viii. සේදෑරි කරනවා - .................................................................

ix. මීසම - ....................................................................

x. අනාථාවක් - ...................................................................

(ලකුණු 1x10 = 10)

05.) පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

i. ජාතක පොතෙහි ජාතක ගණන පන්සිය පනහකි ( )

ii. සැළලිහිණි සංදේශය කුරුණෑගල යුගයේ රචිත ග්‍රන්ථයකි. ( )

iii. "කෝමල රේඛා" චන්ද්‍රරත්න මානවසිංහයන්ගේ නිර්මාණයක් නොවන්නේය. ( )

iv. ජනකවිවලට අයත්වන්නේ පැල්කවි, පාරු කවි, කමත් කවි, පමණි. ( )

v. අක්කර පහ මඩවල එස්.රත්නායක මහතාගේ කෘතියකි. ( )

(ලකුණු 2x5 = 10)

06.) පහත සඳහන් ගද්‍ය පාඨවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

i. ඉසුරෙන් පිරිහුණත්

සුදන තම ගුණය අඩු නොකරත්

බිඳුණක් රන් බඳුන

ඇති බර අගය අඩු නොවන මෙන්

..........................................................................................................................................

..........................................................................................................................................

ii. "නල මුදු සුවඳ පිරි කුඹු මියුරු අඹ ගෙඩි

පුල හෙළ කුසුම ලිය පිය තෙපල රන් කෙඬි

සල සුදු සෙමෙර සේසත් ගිජිඳු නොද වැඩි

බල සුබ නිමිති පෙරමඟ නැකතටත් වැඩි."

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ලකුණු 2x5 = 10)

07.) ජනකවි වර්ග 02 ක් නම්කර ඒවාට උදාහරණ 01 බැගින් ලියන්න.

| | |
|---|---|
| ...................................................... | ...................................................... |
| ...................................................... | ...................................................... |
| ...................................................... | ...................................................... |
| ...................................................... | ...................................................... |
| ...................................................... | ...................................................... |

(ලකුණු 2x10 = 20)

08). පහත දැක්වෙන පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කිසිවෙකු දෙලොවැඩට
හික්මීම මුල් වේ මැයි.
එයද වැඩිහිටි නැණවත්
උතුමන වෙතින්විය යුතුය.
හොඳින් හික්මුණු සිප්
සත් දන උගත් මිනිසා.
සලසාලමින් දෙලොවැඩ
සැප වළඳන්නේය.
උසස් කුලමනදනා
ඉසුරු සම්පත් ඇතිවද
සිප් සත් නොදතුයේ සෙබ
මැද කැළෑ මල මෙන් වේ.

i. මෙහි සඳහන් පරිදි දෙලොව වැඩට මුල්වන්නේ කුමක්ද?

..........................................................................................

ii. දෙලොව වැ ඩසලසමින් සැප වළඳන්නේ කවුරුන්ද?

..........................................................................................

iii. ශිල්ප ශාස්ත්‍ර නොදත් තැනැත්තා කවරකු වැනි යයි මෙහි සඳහන් වේද?

..........................................................................................

iv. “ඉසුරු සැප වළඳන්නේය ” මෙහි අදහස කුමක්ද?

..........................................................................................

v. මෙම පැදි පෙළ සඳහා යෝග්‍ය මාතෘකාවක් යොදන්න.

..........................................................................................